## ලංකාවේ වී ගොවි තැන සඳහා බලශක්ති භාවිතය

# ට්‍රැක්ටරයේ තැන මීහරකාට දිය යුතුයි

සුළු ගොවිතැන් සඳහා සත්ත්ව බලය වැඩි වැඩියෙන් භාවිතා කොට ට්‍රැක්ටර් පාවිච්චිය හැකි තරම් දුරට අඩු කළ යුතු බව පෙන්නා දෙන මෙම ලියුම්කරු එවැනි පියවරක් ජාතික ආර්ථිකයේ සුබ සිද්ධියට හේතුවනු ඇති බවද පවසයි.

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී ෆෙඩරික් අබේරත්න විසිනි



අප කවුරුත් දන්නා පරිදි ලංකාවේ ජාතික ආදායමෙන් 30% ක් පමණ ලැබෙන්නේ ගොවිතැනින්ය. එම කොටසින් 36% ක් පමණ වතු අංශයේ තේ, රබර්, පොල් වැනි නිෂ්පාදන වලින්ද, ඉතිරි 64% ක ආදායම් ප්‍රමාණය සුළු ගොවිතැනින්ද ලැබේ. මෙහිදී වී ගොවිතැන ඉතාමත් වැදගත් තැනක් ගන්නේ එක් අතකින් එය අපගේ ප්‍රධාන ආහාරය නිෂ්පාදන කෙරෙන මාර්ගය වන නිසාත්, අනික් අතින් වර්ෂයකදී අක්කර විසි ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් වී ගොවිතැනට යටවෙන නිසාත්ය. එම නිසා වී ගොවිතැනට අදාළ ශක්ති හෝ බල භාවිතය ගැන සැලකිලිමත්වීම ඉතා වැදගත්ය.

වී ගොවිතැනේදී බලය භාවිතා වන කාර්යයන් දෙකක් නම් බිම් සකස් කිරීම සහ අස්වැන්න පැගීමයි. මෙහිදී බල ශක්ති භාවිතයේ ප්‍රමාණය, නොයෙකුත් බල ශක්ති මාධ්‍යයන් භාවිතය සඳහා

වැය වන වියදම් (පුද්ගලික වශයෙන් සහ ජාතික වශයෙන්) සහ බල ශක්ති භාවිතය වඩාත් වාසි වන අන්දමට යෙදවිය යුතු අන්දම ගැනද සැලකීම වැදගත්ය.

බලශක්ති භාවිතයේ දී කරුණු දෙකක් වැදගත් වේ. රට තුළ අභ්‍යන්තර වශයෙන් පාලනය කළ හැකි බල මාධ්‍යයන් සහ අභ්‍යන්තර වශයෙන් පාලනය කළ නොහැකි බල මාධ්‍යයන් වශයෙනි. මුල් ගණයට වැටෙන්නේ ගොවිපල වැඩ සඳහා භාවිතා කළ හැකි මිනිස් බලය සහ මී හරක් බලයයි. දෙවැනි ගණයට පිටරටින් ආනයනය කෙරෙන ඉන්ධන යොදවා භාවිතා කරන ට්‍රැක්ටර් අයත් වේ.

මුළු ලංකාවේම ගොවිතැන සඳහා භාවිතා කිරීමට හැකි රෝද 4 ට්‍රැක්ටර් සංඛ්‍යාව 8,500 ක් පමණ වන අතර රෝද 2 ට්‍රැක්ටර් සංඛ්‍යාව 6,600 ක් පමණ වේ. මේ අතර, මී හරකුන් 3,81,000 ක් පමණ සිටිති. ට්‍රැක්ටර් සහ මී හරකුන් අතුරෙන් වැඩි කොටසක් වියළි කලාපයට සීමා වී ඇත. උදහරණයක් වශයෙන් රෝද 4 ට්‍රැක්ටර් වලින් 60% ක්ද; රෝද 2 ට්‍රැක්ටර් වලින් 45% ක්ද ඇත්තේ වියළි කලාපයෙහිය. මේ හැරෙන්නට, මී හරකුන් ගෙන් වියළි කලාපයට අයත් වන සංඛ්‍යාව 40.5% ක් වේ.

බිම් සකස් කිරීම

විශේෂයෙන් වී ගොවිතැනේදී සැලකියයුතු බල ශක්ති ප්‍රමාණයක් භාවිතා වනුයේ බිම් සකස් කිරීම සඳහාය. ශ්‍රමය පමණක් යොද බිම් සකස් කරනුයේ නම් අක්කරයකට ඒ සඳහා රු. 386.00 ක් පමණ වැය වෙයි. බිම් සකස් කිරීම මී හරකුන් මගින් නම් රු. 350.00 ක්ද ට්‍රැක්ටර් මගින් නම් ඒ සඳහා රු. 400.00 ක් පමණද වැය වේ. එම නිසා පුද්ගලික වියදම් රටාවේ එතරම් වෙනසක් මෙහිලා නැති බව පෙනේ. නමුත්, මෙම වියදම් ප්‍රමාණය සාමාජීය වියදමක් නැත්නම් ජාතික වියදමක් ලෙස සැලකුවිට විශාල වෙනසක් එක් එක් බල ශක්ති මාධ්‍යයන් අතර ඇති බව පෙනේ. මෙයට ප්‍රධාන හේතුව ට්‍රැක්ටර් සඳහා වැයවන ඉන්ධන රජය මගින් සහනාධාර මිලකට සපයනු ලැබීමය. උදහරණයක් වශයෙන් ඩීසල් ගැලුමක් සඳහා ගොවි මහතාට රු. 20.00 ක් පමණ වැය වන නමුත් රජයට ඒ සඳහා රු. 40.00 ක් පමණ වැය



තෙල් හිඟයි ගාස්තුව වැඩියි

කිරීමට සිදුව ඇත. එමනිසා, සත්‍ය වියදම දෙගුණයක් පමණ වේ. මේ අනුව, රජයට 1979 වර්ෂයේදී රුපියල් කෝටි 14.5 ක් පමණ ගොවිබිම් සකස් කිරීම වෙනුවෙන් විදේශ විනිමය වශයෙන් වැයවී ඇත.

අප විසින් මෙහිදී සඳහන් කරන ලද්දේ ඉන්ධන වලට යන වියදම් පමණි. නමුත්, සත්‍ය වියදම් වල පරතරය මීටත් වඩා වැඩිය. ට්‍රැක්ටරයේ මිල, එසේම උපකරණ වලට යන වියදම, ට්‍රැක්ටර් මිලදී ගැනීම සඳහා බැංකු ණය ගන්නේ නම් පොලිය, බල ඒකකයක ජීවිත කාලය යනාදිය සැලකුවිට වියදම් පරතරය තවත් වැඩිවේ. එම ආර්ථික වියදම සැලකූ විට අක්කරයක බිම් ප්‍රමාණයක් සකස් කිරීම සඳහා මී හරක් යුගලකට රු. 163.00 ක් පමණ වියදම් වන අතර රෝද 2 ට්‍රැක්ටරයකට රු. 295.00 ක්ද, රෝද 4 ට්‍රැක්ටරයකට රු. 319.00 ක් පමණද ජාතික වශයෙන් වැය වී ඇත. මෙයින් අපට පෙනෙනුයේ ට්‍රැක්ටරයකින් හැමට යන වියදම මී හරකුන් මගින් හැමට වඩා දෙගුණයක් පමණ වන බවයි. මේ වියදම් අනුව, දැනට මී හරක් යොද පිළියෙල කරන ඉඩම් ප්‍රමාණය ට්‍රැක්ටර් මගින් පිළියෙල කරනවා නම් ජාතික වියදම රු. කෝටි 13.4 කින් වැඩිවන අතර, දැනට ට්‍රැක්ටර් වලින් හාන බිම් ප්‍රමාණය මී හරකුන් මගින් කෙරෙන්නේ නම් ජාතියට ඉතිරිවන මුදල රු. කෝටි 16.4 ක් පමණ වේ.

අස්වැන්න පෑගීම

වී වගාවේදී මිළහට ශක්තිය අධිකව වැය වන්නේ අස්වැස්න පෑගීම සඳහාය. බිම් සකස් කිරීමේදී මෙන්ම අස්වැන්න පෑගීමේදීද ජාතික

වශයෙන් අති විශාල වියදමක් රෝද 4 ට්‍රැක්ටර් භාවිතය නිසා වැය වන බව පෙනේ. උදහරණයක් වශයෙන්, ජාතික ආර්ථික වියදම රෝද 4 ට්‍රැක්ටරයක් සඳහා අක්කරයකට රු. 235.00 ක් වන අතර මී හරකුන් සඳහා එය රු. 81.00 ක් පමණි. නමුත්, මුදල් වශයෙන් ගොවි මහතාට මෙම මාධ්‍ය දෙකට රු. 100.00 ක් පමණ වැය වේ. එමනිසා මෙහිදී අපට පෙනෙනුයේ ට්‍රැක්ටර් මගින් ගොයම් පැගීම මී හරකුන් මගින් කරනවාට වඩා ආර්ථික වශයෙන් අධික මිල සහිත බවයි.

එමනිසා, ඉහත සඳහන් කරුණු අනුව ට්‍රැක්ටර් භාවිතය ජාතික වශයෙන් ඉතා මිල අධික බව පෙනී යයි. ඉන්ධන භාවීතය ගැන පමණක් සැලකූවිට අපට පෙනෙනුයේ බිම් සැකසීම හා අස්වැන්න නෙලීම සඳහා රුපියල් කෝටි 20 ක් පමණ වැය වී ඇති බවත්, මෙය 1979 ඉන්ධන ආනයන බිලෙන් 5% ක් පමණ වන බවත් ය.

ලෝකයේ ඉන්ධන මිල වැඩි වීමත් සමගම මේ වියදම අනාගතයේ දී රටට දැරීමට අපහසු වනු ඇත. එසේම ට්‍රැක්ටර් මිලදී ගැනීමේදී අපගේ වටිනා විදේශ විනිමයද වැයවේ. ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මගින් කරන ලද සමීක්ෂණයකින් හෙළිවූ කරුණක් නම් ඇත්ත වශයෙන්ම මෙරට තිබෙන ට්‍රැක්ටර් ප්‍රමාණය අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි බවත්, ඒවායේ භාවිතය ට්‍රැක්ටරයක ප්‍රශස්ථ භාවිතයෙන් 50% කට වඩා අඩු බවත්ය, මේ කරුණු දෙස බලන කල වැඩි වැඩියෙන් ට්‍රැක්ටර් මත යැපීම සුදුසු නැති බවත්, ට්‍රැක්ටර් භාවිතය නිසා නැවත ඉපදවිය හැකි (සත්ව බලය) බල මාධ්‍යයන් හා නැවත ඉපදවිය නොහැකි (ඉන්ධන) බල මාධ්‍යයක් අතර තිබෙන ජාතික ආර්ථික වියදම් පරතරය වැඩිවන බවත් පෙනියයි.

අපගේ පරමාර්ථය විය යුත්තේ සුළු ගොවිතැන් සඳහා සත්ව බලය වැඩි වශයෙන් භාවිතා කිරීමත්, හැකි සෑම අවස්ථාවකදීම ට්‍රැක්ටර් භාවිතය ක්‍රම ක්‍රමයෙන් සීමා කිරීමත්ය. මෙවැනි පරමාර්ථයන් මුදුන් පත් කර ගැනීම සඳහා රජය මගින් ට්‍රැක්ටර් ආනයනය කිරීම සීමා කළ යුතුව ඇත. එසේම, දැනට සහනාධාර මිල යටතේ සපයන ඉන්ධන ප්‍රමාණයද සීමා කළ යුතුයි. මීට අමතරව, මී හරකුන් භාවිතය වැඩි කිරීම හා මී හරකුන්ගේ කාර්යක්ෂමතාවය නැංවීමද සඳහා දිගුකාලීන අභිජනන වැඩ පිළිවෙලක්ද ආරම්භ කළයුතු අතර මී හරකුන් මිලදී ගැනීම සඳහා සුළු ගොවීන්ට රජය මගින් ආධාරද දිය යුතුය.